# ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කෘෂිකර්මය

# හේන් වගාවේ අනාගතය

**ආර්.එන්.එල්. ජයතිස්ස**
**පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරි**
**කෘෂි කාර්මික ප්‍රතිපත්ති හා ව්‍යපෘති ඇගයීම් අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## ප්‍රවේශය

**අතීතයේ ඉන්දියාවේ මිනිස් වාසස්ථාන පැවති බවට විශ්වාස කරන වසර දශ ලක්ෂය තුල විවිධ අවස්ථාවන්හි දී, ශ්‍රී ලංකාව එම උප මහද්වීපයට සම්බන්ධව පැවති බවට සාධක පවතී. (දැරණියගල - 1997) පසුව ඇති වූ දේශගුණික විපර්යාස නිසා වසර 7000 කට පමණ පෙර රටවල් දෙකක් ලෙස වෙන්වීමක් සිදු වී ඇතැයි විශ්වාස කෙරේ. මෙම සබඳතාවය මත ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විවිධ සබඳතා පැවති ඇත.**

මෙම සබැඳියාව මත ඉන්දීය මානවයන් ශ්‍රී ලංකාවට පැමිණිය ද, ඊටත් පෙර සිටම ශ්‍රී ලංකාවේ මිනිස් ජනාවාස පවතින්නට ඇතැයි විශ්වාසයක් පවතී. මෙයට වසර 123,000 කට පෙර කාලය වන විට, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පැවති බවට තොරතුරු අනාවරණය කොට ගෙන තිබේ **(දැරණියගල 1997).**

ශ්‍රී ලංකාවේ ආදී මානවයින් ශිලා මෙවලම් භාවිත කරමින් දඩයම් සහ ස්වාභාවිකව වැවුන විවිධ ශාක සහ අල වර්ග භාවිතයෙන් ආහාර පාරිභෝජන ජීවන රටාවක් පවත්වාගෙන ගොස් තිබේ. ඒ අනුව මොවුන් ගොවිතැනේ නියැලී නැත. ඉන්පසු, ක්‍රි.පූ. 300 හා ඒ ආසන්න යුගයේ දී, ඉන්දු ආර්යයන් ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් පැමිණීම හා ඓතිහාසික ගල් මෙවලම් තාක්ෂණය අභාවයට ගොස් ඒ වෙනුවට යකඩ තාක්ෂණය ප්‍රචලිතව විය. තඹ මිශ්‍ර ලෝහ මෙවලම් නිෂ්පාදනය, උසස් තත්ත්වයේ මැටි බඳුන්, ගවයින් ආදී හා අශ්වයින් ඇති කිරීම, වී ගොවිතැන වැනි දියුණු ලක්ෂණ මේ යුගයේ දිස් විය. ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දු ආර්යයන් සහ දේශීය ජනතාව අතර සම්මිශ්‍රනයක් ක්‍රමයෙන් සිදුවීම සමඟ දේශීය ජනතාවගේ අනන්‍යතාවය ගිලිහෙමින් ආර්ය සංස්කෘතිය මෙරට ප්‍රචලිත වීම ආරම්භ වූ බව සඳහන් වේ. ඉන්දු ආර්ය ජනතාව ඝන වනාන්තර එළි - පෙහෙළි කොට හේන් තනා ධාන්‍ය වගා කිරීමත් වාරිමාර්ග ආශ්‍රයෙන් ධාන්‍ය වගා කිරීමත්, පිළිබඳව අත්දැකීම් ලබා සිටියෝය.

භාරතයට ඇතුල් වී එහි දේශීය ජන කොට්ඨාසය සමඟින් මිශ්‍රව ආර්යයන් ගොවිතැන් කටයුතු යම් ලෙසකින් ආරම්භ කලේ ද, එපරිද්දෙන්ම, ශ්‍රී ලංකා දේශයට ඇතුල් වූ ආර්ය ජනයා ද එහි ජීවත් වූ ආදිවාසී ජනතාව සමඟ එකතු වී මිශ්‍ර ගොවිතැන් ක්‍රමයක් ආරම්භ කලේය **(අනුරාධ සෙනෙවිරත්න: 2001).**

## හැඳින්වීම

මේ ආකාරයෙන් ශ්‍රී ලංකාව තුළ ආරම්භ වූ ගොවිතැන ක්‍රමයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන රකියාව බවට පත්විය. දේශීය කෘෂිකාර්මික උපකරණ, දේශීය දැනුම, දේශීය බීජ, සිය ශ්‍රමය භාවිතයෙන් ශ්‍රී ලාංකික ජනතාව කෘෂිකර්මයේ නිරතවෙමින් තම ආහාර නිපදවා ගනු ලැබිය. මෙම ක්‍රියාවලිය සාම්ප්‍රදායික කෘෂිකර්මය වශයෙන් හැඳින් වේ. සාම්ප්‍රදායික කෘෂිකර්මය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන **පුල්ටස් 1963** දී, මෙසේ දක්වයි.

**"පරම්පරාවන් ගණනාවක් තිස්සේ පාවිච්චි කරනු ලැබූ නිෂ්පාදන සාධක විශේෂය - ක් අනුවම කර ගෙන යන ගොවිතැන සාම්ප්‍රදායික කෘෂිකර්මය යි."**

හේන් නැමැති වගා ක්‍රමය, ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ වෙනත් රටවල ද දක්නට හැකි දශක ගණනාවක් තිස්සේ පාරම්පරිකව පවත්වාගෙන එන කෘෂිකාර්මික ගොවිපල ක්‍රමයකි **(අබේරත්න සහ තවත් අය 1986).**

මෙම ලිපියේ දී, සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ පාරම්පරික කෘෂිකර්මයේ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන **හේන් වගාව** හා එහි වර්තමාන වැදගත්කම, මුහුණදෙන ගැටළු සහ අනාගතය යන කරුණු සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් දේශීය කෘෂිකර්මය ප්‍රධාන කොටස් තුනකට වෙන් කිරීමට හැකිය. එනම් වාරිමාර්ග වී වගාව, ගෙවතු සහ හේන් වගා ක්ෂේත්‍රය ලෙසිනි. විශේෂයෙන්ම, හේන් වගාව සිදු කරන්නේ ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ සහ අන්තර් කලාපයෙහි ය. තෙත් කලාපයේ ද, අතීතයේ දී හේන් වගාව පැවතිනි. වසරේ ජූනි, ජූලි මාසයන් හි කැලෑ කපා සුද්ද කොට මාසයක් පමණ ඒවා වියැලෙන්නට හැර ගිනි තබා පුළුස්සා බෝග වගා කිරීමට සුදුසු ලෙස ක්ෂේත්‍රය සකසා ගනී. ඉන් පසුව, ඇරඹෙන ඊසාන දිග මෝසම් වර්ෂාවේ ප්‍රථම වර්ෂා අවදියේ දී, මෙම ක්ෂේත්‍රයේ බෝග සිටුවීම සහ වැපිරීම සිදු කරයි. මෙය සිංහල භාෂාවෙන් **හේන** වශයෙන් හඳුන්වන අතර මෙම ඉඩම් කැබැල්ල දෙවතාවක් හෝ තුන් වතාවක් නොකඩවා වගා කරයි. ඉන් පසුව, වසර ගණනාවක් වගා නොකොට

අතහැර දමයි. මෙම **අත්හරිනු ලබන වසර ගණනාව** (fallow period) තීරණය වන්නේ නව වනාන්තර පැවතීමේ සුලභතාවය අනුව ය. මෙය ශ්‍රී ලංකාවේ **සල ගොවිතැන** (shifting agriculture or *chena*) නැත්නම් හේන් වගාව ලෙස හඳුන්වයි. ශතවර්ෂ ගණනාවක් තිස්සේ මෙම හේන් වගාව ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන අතර වර්තමානයේ දී පවා මෙම වගාව ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි **(අබේරත්න 1986)**.

## ශ්‍රම භාවිතය

හේන් වගාවේ දී ගොවීන් භාවිතා කරන්නේ මිනිස් ශ්‍රමයයි. එය පවුලේ ශ්‍රමය මෙන්ම **අත්තම් ශ්‍රමය** වන්නේය. හේන් වගාව ඇරඹීම සඳහා කැලෑ කැපීමේ සිට බෝග වපුරා හෝ සිටුවා අස්වනු නෙලන තුරුම භාවිතයට ගැනෙන්නේ පවුලේ ශ්‍රමය හෝ අත්තම් ශ්‍රමය යි. භාවිත උපකරණ, කැත්ත පිහිය, උදැල්ල වැනි දේශීය උපකරණයන් ය. හේන් වගාවේ දී බෝග වගා වලට රසායනික පොහොර යෙදීමක් හෝ කෘමිනාශක ඉසීමක් ද නොකරනු ලබයි. එම නිසා, හේනේ නිෂ්පාදිත බෝග වර්ග වල පෝෂණ ගුණය අධික වන අතර නිෂ්පාදන වියදම ද පහළ අගයක් ගනී.

1970 දශකය පමණ දක්වා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජයේ ජන ජීවිතය බෙහෙවින්ම සරල විය. ආහාර අවශ්‍යතාවයෙන් වැඩි කොටසක් දේශීය වශයෙන් නිපදවා ගත්තේය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වැඩි වශයෙන් හා තෙත් කලාපයේ ඊට සාපේක්ෂව අඩුවෙන් ද, හේන් වගාව ප්‍රධාන කෘෂිකාර්මික අංශයක්ව පැවතිණි. ජනතාවගේ ආහාර අවශ්‍යතා සපුරා ගන්නා ලද්දේ හේන් වගා කිරීමෙනි. හේන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කැලෑ සොයා ගැනීම ප්‍රශ්නයක් නොවූයේය. ගම්මුන් සියළුම දෙනා එකතු වී කැලෑ කැපීම හා හේන් පිළියෙල කිරීම හා බෝග වැපිරීම කළ අතර රැකබලා ගැනීම හා අස්වනු නෙලීම අන්‍යෝන්‍ය ශ්‍රම හුවමාරුව මත සිදු කළේය. විශාල වනාන්තර සහිත කැලෑ පුළුස්සා පිළියෙල කිරීම නිසා සාරවත්භාවය ඉහළ මට්ටමකින් පැවති අතර ලැබූ අස්වැන්න ද ප්‍රශස්ත මට්ටමක පැවතිණි. පස සරු කිරීම් උපක්‍රම, වල් නෙලීම, පරිසරය සුරැකීම වැනි ගැටළු එකල උද්ගත නොවූයේය. එම නිසා, **හේන් වගාව පරිසර හිතකාමී කෘෂිකර්ම මාධ්‍යයක් විය (අබේරත්න 1986).**

## හේන් වගා ක්ෂේත්‍රයේ ආර්ථික වැදගත්කම

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රමුඛ කෘෂිකාර්මික ක්‍රමය වන්නේ වී වගා කිරීමයි. මේ සඳහා නිසි වාරිමාර්ග පද්ධතියක් අත්‍යාවශ්‍ය සාධකයකි. වියළි කලාපය පුරා විසිරී ඇති පුරාණ ගම් වැව් සහ 1950 දශකයේ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ මහා වාරිමාර්ග සහ මහවැලි යෝජනා ක්‍රමය මඟින් වාරි ජලය සපයන ඉඩම්වල වී වගා කිරීම සිදුකරයි. මෙම වාරිමාර්ග යටතේ වී වගා කිරීම ද, ඇතැම් අවස්ථාවල දේශගුණික සාධක මත වර්ෂාව අඩු වීමෙන් ප්‍රමාණවත් ජලය නොලැබියාම නිසා සීමා කිරීමට සිදුවන අවස්ථා තිබේ. උදාහරණ 2004 යල කන්නය ගත හැකිය. ශ්‍රී ලංකාවේ මහා වාරිමාර්ග සඳහා ප්‍රමාණවත් ජලය නොලැබීම නිසා වී වගා නොකිරීමට හෝ සීමා කිරීමට සිදුවිය. **කවුඩුල්ල** මහා වාරිමාර්ග ව්‍යාපාරය යටතේ වී වගාවක් සිදු වූයේම නැති අතර **මින්නේරිය** මහා වාරිමාර්ග ක්‍රමය යටතේ **බෙත්ම ක්‍රමයක්** ක්‍රියාත්මක විය.

වාරිමාර්ග මඟින් ජලය සැපයීමට නොහැකි වර්ෂාපෝෂිත විශාල බිම් ප්‍රමාණයක් හේන් වගාව යටතේ බෝග වගාව සඳහා යොදා ගෙන තිබේ. මෙමඟින් ජීවිකාව රැකගන්නා පිරිසගේ විශාලත්වය සහ මෙම ක්ෂේත්‍රයෙන් රටට සැපයෙන ආහාර බෝග නිෂ්පාදනයේ ප්‍රමාණය මත, මෙම වර්ෂාපෝෂිත භූමියෙහි වගාව ආර්ථික වශයෙන් වැදගත් කමක් උසුලයි.

වාරි ජලය හිඟවීම මත වී වගාව සීමාවීමක් වන බව මෙයින් ප්‍රත්‍යක්ෂ වේ. වාරි ජලය සැපයීම මඟින් වී වගා බිම් බවට පත් කිරීමට නොහැකි, එහෙත් කෘෂිකර්මාන්තය සඳහා යෝග්‍ය විශාල බිම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ උතුරු, උතුරු මැද, ඌව හා ගිනිකොණ දිග ප්‍රදේශවල දක්නට ලැබේ. වැඩිවන ජනගහනය හා විශාල වශයෙන් පුළුල් වී ඇති, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන රැකියාවන් හි යෙදී සිටින ශ්‍රම හමුදාව සහ සමස්ත ලාංකික ආහාර අවශ්‍යතාවය සඳහා ආහාර සැපයීමේ කාර්ය වාරිමාර්ග ආශ්‍රයෙන් නිෂ්පාදිත ආහාර බෝග වලට පමණක් කළ නොහැකිය. හේන් ආශ්‍රයෙන් නිෂ්පාදිත බෝග වලට මේ සඳහා විශාල දායකත්ව හැකියාවක් පවතී. එමනිසා, වර්ෂා පෝෂිත ප්‍රදේශයන් හි, පවතින භූමියෙන් උපරිම ඵල නෙලාගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී හේන් වගාව එහි ප්‍රමුඛ අංගයක් ලෙස දැක්විය හැකිය.

## බෝග වගා කිරීම

හේන් වගාව ද, වී වගාව මෙන් යල - මහ යන කන්න බේදය යටතේ වගා කරයි. වියළි කලාපයට දිගු කාලීන වර්ෂා සමයක් ලබා දෙන්නේ මාස් කන්නයේ ඊසාන දිග මෝසම් වර්ෂාවෙනි. මෙම නිසා දිගු වයස් කාණ්ඩයක් සහිත බෝග වර්ග වැඩි ප්‍රමාණයක් මාස් කන්නයේ දී වගා කිරීමට හැකියාව ලැබේ. ඒ අනුව, බඩ ඉරිඟු, කුරක්කන්, මෙනේරි, එළවළු වර්ග, මිරිස් සහ පළතුරු වැනි දිගු කාලීන බෝග රාශියක් මාස් කන්නයේ දී වගා කෙරේ. යල කන්නය අඩු වර්ෂාපතනයක් පවතින නිසා එතරම් ජලය අවශ්‍ය නොවන බෝග වගා කරනු ලබයි. එහි දී, වඩාත්ම සුදුසු බෝගය වී ඇත්තේ තල බෝගය වන අතර ඒ හැර උඳු, මුං, කව්පි සහ එළවළු වර්ග ද යල කන්නයේ හේන් තුල වගා කෙරේ. මේ සැම බෝගයක්ම යල කන්නයේ අඩු වර්ෂාපතන රටාව යටතේ වගා කිරීමට සුදුසු ඒවා පමණක් වේ.

## බෝග විවිධාංගීකරණය

හේන නමැති කෘෂි ක්ෂේත්‍රයේ වගාවේ දී, ශ්‍රී ලාංකික පාරම්පරික ක්‍රමය වී ඇත්තේ එහි විවිධ බෝග වගා කිරීමයි. ඒ අනුව ධාන්‍ය, එළවළු, මාංශ බෝග, පලතුරු, පලා වර්ග ආදී හැම ආහාර බෝගයක්ම වගා කරයි. එමනිසා, **බෝග විවිධාංගීකරණය** නමැති නවීන කෘෂි විද්‍යාඥයින් පෙන්වා දෙන වගා ක්‍රමය පාරම්පරික හේන් ගොවිතැන යටතේ පැවති එත්තක් බව පැහැදිලි වේ. මෙනිසා, එක් බෝගයක අස්වැන්න නෙලූ පසුව, හේන හිස් නොවන්නේ තවත් බෝග රාශියක් එහි වගා කර ඇති නිසාවෙනි. උදු, මුං, තල, කොල්ලූ, බඩ ඉරිඟු, කව්පි වැනි මාංශ බෝග වර්ග, කොල්ලූ, කුරහන්, තණහාල් වැනි ධාන්‍ය වර්ග, කරවිල, මෑ කරල්, වැටකොළු, පතෝල, කැකිරි, පිපිඤ්ඤා, වට්ටක්කා වැනි එළවළු වර්ග, සාරණ, තම්පලා වැනි පලා වර්ග පැනි පුහුල්, සීනි කැකිරි වැනි පලතුරු වර්ග, මිරිස්, කොච්චි වැනි මිරිස් වර්ග යන විවිධ බෝග හේන නමැති ක්ෂේත්‍රයේ එකට වගා කරයි. එමනිසා, මේ තුළ බෝග විවිධාංගීකරණයක් දක්නට ලැබේ. එය නවීන විද්‍යාත්මක කෘෂිකර්මයට ද අනුකූලය. උසස් අස්වනු ලබාදීම සඳහා බෝග විවිධාංගීකරණය හේතු වන්නකි.

## ගෘහස්ථ ආහාර ආරක්ෂණය

**වියළි කලාපීය ගොවීන් ඉතා ප්‍රබල ලෙස විශ්වාස කරන කරුණක් වන්නේ හේනක් වගා කිරීම යනු එම ගොවි නිවසට සෞභාග්‍ය කැඳවන්නක් බවයි.** එමනිසා, වී වගාවටත් වඩා හේනක් වගා කිරීම සඳහා ප්‍රමුඛත්වයක් දී ක්‍රියාකරනු දැකීමට පුළුවන. එයට හේතුව, ඉහත සඳහන් කළ ආකාරයෙන් ධාන්‍ය, මාංශ බෝග, එළවළු, පලතුරු, පලා වර්ග හා මිරිස් වැනි පවුල් ඒකකයකට ජීවත්වීම සඳහා අවශ්‍ය සියළුම ආහාර ද්‍රව්‍ය හේන විසින් නිපදවන නිසාවෙනි. මෙමඟින් පවුලේ පෝෂණ අවශ්‍යතා ද පිරිමැසේ. මේ සඳහා **පොහොර යෙදීමක්, කෘමිනාශක ඉසීමක් නොකරන නිසා ඉතා අඩු නිෂ්පාදන පිරිවැයකින් ගුණාත්මක බවත්, උසස් ඵලදාවක් ලබා ගැනීමට හැකියාවද පවතී.** ගොවියා විසින් වගා කරන හේනේ ප්‍රමාණය මත ලැබෙන අස්වැන්න තීරණය වේ. මෙම අස්වැන්න තම පවුල් ඒකකයේ ප්‍රමාණය අනුව වසරක් පාරිභෝජනය සඳහා ගබඩා කර තබා අතිරික්තය අලෙවි කර මුදල් ලබා ගනී. පාරම්පරික හේන් ගොවිතැනේ ප්‍රධාන ලක්ෂණය වන්නේ එයයි. එක කන්නයක් හේනක් වගා කිරීම යනු වසරක් සඳහා පවුලේ ආහාර සුරක්ෂිත බව රැක ගැනීමයි. වියළි කලාපයේ ගොවීන් කුමන හෝ දුෂ්කරතා මැද හේනක් වගා කර ගැනීමට උනන්දුවක් දක්වන්නේ මෙම හේතුව නිසාවෙනි. මෙම තත්ත්වය පිළිබඳව විවරණයක යෙදෙන **එච්.යූ.ඒ. තෙන්නකෝන්, 1966 සංස්කෘති සඟරාවේ මෙසේ දක්වයි. අනන මෙනන වැඩි බිම් ප්‍රමාණයක් වපුරා අඩු අස්වැන්නක් ලැබීම වඩා ප්‍රඥා ගෝචර යැයි සමහර විට ඔබ සිතනු ඇත. ඇතැම් අවස්ථා වලදී එය අනුමත කළ නොහැකිය. වියළි කලාපීය වර්ෂාපතනය මූලින් සඳහන් කළ පරිදි අධික විචල්‍යතාවයකින් යුක්තය. අඩු වර්ෂාපතනයක් නිසා වැව් වලට අවශ්‍ය ප්‍රමාණයේ ජලය නොලැබෙන සමහර අවුරුදු ගැන ඔබ අසා ඇතැයි සිතමි. එවිට, ගොවියාගේ පන - නල ගලවා ගැනීමට ඇති එකම මාර්ගය හේනයි. එමෙන්ම, සමහර අවස්ථා වල දී අධික ජල ගැලීම් නිසා මාස් කුඹුරු අධික ලෙස පාළු වීම ද සිදු වේ. එවිට ද එකම සහනය හේනයි. එහෙයින් හේන් ගොවිතැන අනුකම්පා විරහිතව විවේචනය කිරීම නොවටී.** යල කන්නයේ දී ගොවියාට හේන අත හැරීමට බැරි කරුණු දෙකක් තිබේ. යල කන්නයේ වර්ෂාව සාර්ථක ලෙස නොලැබුණ විට මාස් ගොවිතැන අධිකවීම හෝ අතපසු වීම හෝ නිසා යල කන්න උදෙසා වැව් ජලය ඉතිරි නොවීමට ඉඩ තිබේ. එසේ වූ විට යල කුඹුරු අත හැරීමට සිදුවේ. එවිට එකී කන්නයේ දී කිසියම් ආදායමක් සඳහා හේන් කෙටීමට ඔහු නිතැතින්ම පෙළ ඹේ. තව ද, යල් කන්නේ තල හේන් ගොවිතැන සාර්ථක වුවහොත් එයින් සැළකිය යුතු ආදායමක් ලැබිය හැකිය. තල, වියළි කලාපීය ගොවියාගේ ආර්ථික බෝග වගාවකි. හේන් වගාවේ වැදගත්කම පිළිබඳව තවදුරටත් අදහස් දක්වමින් ඔවුහු මෙසේ පවසති. ගමක ජනගහනය වැඩිවීම නිසා දරු මුණුබුරන් අතරෙහි ඉඩම් බෙදී යාමෙන් ඇතිවන ඉඩම් කැබලි වීමෙන් පසුව, එක් අයෙකුට අයත් වපසරිය කුඩා වූ විට අමතර ආදායමක් ලැබීම සඳහා හේන් කෙටීමට සිදු වේ.

මෙයින් පෙනී යන්නේ වියළි කලාපීය ජනයාට හේන් ගොවිතැන නැමැති පාරිභෝජන කෘෂිකර්මය, තම පවුල නඩත්තු කිරීමේ දී වැදගත් පිටිවහලක් වන බවයි. මේ නිසා, **වියළි කලාපීය සාම්ප්‍රදායික කෘෂිකර්මයේ වී වගාව හැරුණු විට, සෙසු ප්‍රධානම ජීවනෝපාය හේන් ගොවිතැන බව මෙතෙක් කරන ලද විවරණයෙන් පැහැදිලි වේ.**

## හේන් ගොවිතැන සම්බන්ධ වර්තමාන ගැටළු

ශ්‍රී ලංකාවේ වැඩිවන ජනගහනය සඳහා ආහාර සැපයීමේ බලාපොරොත්තුවෙන් ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීම උදෙසා ගංගා වියළි කලාපයට හරවා වියළි කලාපයේ විශාල ගොවි ජනපද ව්‍යාපාර ඇති කිරීම නිසා එතෙක් හේන් ගොවිතැන් කරන ලද බිම්, වර්තමානයේ වී වගාව සඳහා යොදා ගෙන තිබේ. මේ නිසා, හේන් වගාව සඳහා යොදා ගැනීමට සිදුවී ඇත්තේ වාරිමාර්ග ආශ්‍රයෙන් ජලය සම්පාදනය කිරීමට නොහැකි උස් බිම් ය. මේවා වගා කල හැක්කේ මෝසම් වර්ෂාව උපකාරයෙන් හේන් වගාවන් ලෙස පමණි. විශාල වශයෙන් ජනගහනය වැඩිවීම නිසා ඒක පුද්ගල ඉඩම් අයිතිය ඉතා කුඩා වීම හේතුවෙන් පෙරමෙන් වනාන්තර නොමැති වීම නිසා පුළුල් කාල පරාසයක් තුල වනාවක් හේනක් වගා කළ බිමක් අත්හැර දැමීමට හැකි වන්නේ නැත. එම නිසා, පෙර මෙන් ඝන

කැලෑ වෙනුවට ලඳු කැලෑ වල හේන් කෙටීමට සිදු ව තිබේ. ජනගහනය වැඩිවීම නිසා පැවති බොහෝ හේන් බිම් බෙදී ගොස් ඒවායේ පදිංචි වීම නිසා වර්තමානයේ ස්ථිර කුඩා ගෙවතු බවට පත්ව ඇත.

වර්ෂාව අඩු වීම නිසා ඉඩම් සාරවත් වීම අඩු වේගයකින් සිදු වේ. තෙත් කලාපයේ අධික වර්ෂාවක් ලැබෙන නිසා මතුපිට පස තුළ හියුමස් පසක් ඉක්මනින් නිර්මාණය වෙයි. වර්ෂාව අඩු නිසා වියළි කලාපයේ මෙලෙස ඉක්මනින් පස සාරවත් වීමක් සිදු නොවේ. මේ නිසා හේන යළි යළිත් වගා කිරීමෙන් නිසරු භාවයට පත්වීම ඉක්මණින් සිදු වන්නකි. මේ නිසා, ඵලදාව අඩුවීමට පටන් ගනී. මෙම තත්ත්වය ජන ජීවිතය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන්නකි.

කැලෑ කපා පිලිස්සීම නිසා පස බුරුල් වීමත්, පස නිරාවරණය වීමත් නිසා වර්ෂා සමයේ දී සහ වියළි සමයේදීත් පාංශු ඛාදනය විශාල වශයෙන් සිදු වේ. මේ නිසා ද පසෙහි සාරවත් කොටස් හා මතුපිට පස් විශාල වශයෙන් සෝදා පාළුවීමට ලක් වේ. මෙමඟින් අත්වන ප්‍රතිඵල වන්නේ ඵලදාව අඩුවීමයි.

මහා පරිමාණ කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රම සඳහා පැවති කැලෑ පාරිභෝජනයට ගැනීමත්, ඉතිරි වර්ෂා පෝෂිත ප්‍රදේශවල හේන් සහ ගෙවතු සෑදීමත් නිසා කලක් මෙම වන ගහනවල ජීවත් වූ වන සතුන් රක්ෂිත කැලෑ වශයෙන් වෙන් කර ඇති සීමිත ප්‍රදේශ වලට සීමා වී සිටී. මේ නිසා, වර්ෂාව අඩු සමයේ වනාන්තරයේ ආහාර හිඟ කාලයට මෙම වන සතුන් ගොවි බිම් වලට කඩා වැදී ඒවායේ බෝග වර්ග ආහාරයට ගනී. මේ නිසා වන සත්ත්ව - හේන් ගොවි ගැටුමක් නිර්මාණය වී තිබේ. මෙයින් මේ දෙපිරිසම මිය යයි. මෙම තත්ත්වය ද සැලකිල්ලට ගත යුත්තකි.

කාලීනව හේන් වගාව සිදු කරන බැවින් ඒවායේ අස්වැන්න එකම කාලයක දී ලැබීම නිසා ගොවීන්ට අලෙවි ගැටළු වලට මුහුණ දීමට සිදු වී තිබේ. වනාන්තර හෙළි කිරීමට නීතියෙන් ඉඩ කඩ අහුරා තිබීම, ව්‍යාප්ති සේවා ලබා ගැනීමේ දුර්වලතාවය, නව තාක්ෂණය ලබා ගැනීමට ඇති අරමුදල් හිඟකම වර්තමානයේ හේන් ගොවිතැන සම්බන්ධයෙන් උද්ගතවී ඇති ගැටළු සමහරකි.

## අතිරේක ආහාර සඳහා ඇති ශක්‍යතාවය

ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහල් හැරුනු විට වෙනත් අතිරේක ආහාර බෝග වර්ග ආනයනය කරනු ලබයි. 1993 සිට 2003 දක්වා වසරවල ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද බඩ ඉරිඟු, තල, මුං ඇට, මිරිස්, කුරක්කන්, රටකජු සහ උඳු යන බෝග වල නිෂ්පාදිත ප්‍රමාණයන් (මෑත වර්ෂ වල ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ඉහත සඳහන් කරන ලද බෝග වර්ගයන් හි) ආනයනිත ප්‍රමාණයන් සහ ඒ සඳහා ශ්‍රී ලංකාව වැය කළ විදේශ විනිමය වටිනාකම වගු අංක 1 හා 2 මඟින් දක්වා තිබේ. මෙමඟින් පෙනෙන්නේ සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් මෙම බෝග ආනයනය කිරීම සඳහා වැය කර ඇති බවයි.

මෙම බෝග වර්ග ආනයනය නොකොට ශ්‍රී ලංකාව තුළ ඇති වර්ෂා පෝෂිත බිම් උපයෝගී කරගෙන ඒවා වගා කිරීමට හැකියාව තිබේ.

## අර්ධ ස්ථාවර උස්බිම් වගාව සම්බන්ධ ක්ෂේත්‍ර පර්යේෂණ:

මේ ආකාරයට තැනින් තැනට මාරු වෙමින් ගොවිතැන් කරන සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රමය වෙනුවට එකම භූමියක වර්ෂා පෝෂිත ගොවිතැන් රටාවක් පවත්වාගෙන යාම, බාධක වලට මුහුණ දීමකි. එකම බිමක වගා කිරීම නිසා බිමෙහි සාරවත් භාවය ක්‍රමයෙන් අඩුවීමට පටන් ගැනීම නිසා අස්වැන්න අඩුවෙයි. අඛණ්ඩව වගා කිරීම නිසා පසෙහි සෝදා පාළුව ඉහළ යාමෙන් පසෙහි පෝෂක කොටස් ඉවත් වී යයි. මෙම කරුණු සියල්ලෙහිම අවසන් ප්‍රතිඵලය ලෙස ගොවිජන ජීවිතය පහළ මට්ටමකට පත්වීම සිදු වේ. මෙලෙස ස්ථාවරත්වයට පත් වූ ගොවි බිම් වල කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය කිරීම මාර්ගයෙන් එම බිම්වල ඵලදායීතාවය සුරක්ෂිත කිරීම පිළිබඳව ක්ෂේත්‍ර පර්යේෂණයක් **තිරප්පනේ** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී ක්‍රියාවට නංවන ලදී. ගොවි ජනතාව කේන්ද්‍ර කොටගත් **කෘෂි කාර්මික සම්පත් කළමනාකරණ** (FARM) **වැඩසටහන** නමින් එකී වැඩ සටහන හඳුන්වන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය දායකත්වය මත ආසියානු කලාපයේ රටවල් 7 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. ආසියානු කලාපයේ වර්ෂා පෝෂිත ප්‍රදේශයන් හි ජනතාව, ස්වාභාවික හා කෘෂිකාර්මික සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීමට දායකවීම තුලින් ප්‍රජාවේ ආහාර සුරක්ෂිතභාවය සහ සම්පත් ආරක්ෂා කිරීම මෙම FARM වැඩසටහනෙහි මූලික දැක්ම විය. වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේ අදාළ ප්‍රදේශයේ ජනතා සහභාගීත්ව ප්‍රවේශය තුලිනි. වර්ෂාපෝෂිත ප්‍රදේශයන් හි, ස්වාභාවික සම්පත් නිසිලෙස භාවිතා කිරීම, කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම, මෙහි පරමාර්ථ අතර විය. තම ගොවිබිම් තැනින් තැනට මාරු කරමින් **සල ගොවිතැනේ** යෙදීම වෙනුවට එක් ස්ථානයක ගොවිතැන් කිරීමේ දී ගොවියා මුහුණ දෙන ගැටළු මඟ හරවා ගනිමින් තිරසාර වගා ක්‍රමයක් සහිත තිරසාර සංවර්ධනයක් සහතික කර ගැනීම සඳහා වූ අත්හදා බැලීම් මෙම ක්ෂේත්‍රයේ දී සිදු කරනු ලැබිය. වගාවේ දී ගොවියා මුහුණදෙන ජල ප්‍රශ්නය සඳහා දිගු කාලීන විසඳුමක් වශයෙන් ඉඩම්වල ජල සංරක්ෂණය සඳහා පස් වැටි ඉදි කිරීම, කෙටි කාලීන විසඳුම් වශයෙන් සමූහ කෘෂි ළිං ඉදිකිරීම, මුට්ටි ජල සම්පාදන ක්‍රමය ආශ්‍රයෙන් ඒ සඳහා උචිත බෝග වශයෙන් කජු, අඹ, දෙහි, දොඩම්, කෙසෙල්, පැපොල් වැනි බෝග වගා කිරීම, සත්ත්ව පාලනය සමඟ බෝග වගා කිරීම යන ඒකාබද්ධ කෘෂිකර්මය මාර්ගයෙන් ජල පෝෂක

කළමනාකරණය මෙම පරිසරය සඳහා සුදුසු බෝග හඳුනා ගැනීම සහ ගොවි පුහුණු වැඩ සටහන් මෙම සුවිශාල වැඩසටහන යටතේ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරනු ලැබිය. මෙමඟින් උත්සාහ දරන ලද්දේ සාම්ප්‍රදායික කෘෂිකර්මය මුහුණදෙන ගැටළු සඳහා ක්ෂේත්‍රය තුළින්ම අත්හදා බැලීම් ආශ්‍රයෙන් විසඳුම් ලබා ගනිමින් සාම්ප්‍රදායික කෘෂිකර්මය වර්තමානයේ මුහුණ පා සිටින අභියෝග ජය ගැනීම සඳහා ගොවි ප්‍රජාව මෙහෙය වීමට ය.

හේන් සඳහා කැලෑ හිඟය හේතුවෙන් පෙරමෙන් විශාල අත්හැර දමන ලද, කාලයක් සහිත නව කැලෑ ඉඩම්වල හේන් කෙටීමට අනාගතයේ දී ගොවීන්ට හැකියාවක් නොමැත්තේය. **Repetto (1989)** ගණනය කොට ඇති අන්දමට 1981-1985 කාලය තුළ ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 5800 ක් පමණ වනාන්තර විනාශ වී ඇති අතර වාර්ෂිකව සාමාන්‍යයෙන් 2.1% ක වේගයෙන් වනාන්තර විනාශ වී ඇති බව සඳහන් කොට තිබේ. **(සොබා 2001).** ඉහත දැක් වූ ආකාරයට හේන් ගොවිතැන ඉතා වැදගත් ආර්ථිකමය ක්ෂේත්‍රයක් වුව ද එය අතීතයේ පැවති ආකාරයෙන්ම ඉදිරියට ද කරගෙන යාමට කිසිසේත්ම නොහැකි බව අප පිළිගත යුත්තේය. එම නිසා, මෙම වැදගත් ආර්ථිකමය ඵලදා ඒකකයක් වන **හේන** තැනින් තැනට සංචලනය නොකරමින් ස්ථාවර ඉඩම් ඒකකයක හෝ ඉඩම් ඒකක සීමිත සංඛ්‍යාවක පමණක් පවත්වාගෙන යාමට අවදානය යොමු විය යුතුය.

## නිගමන

හේන් ගොවිතැන ඉහත සඳහන් කළ ගැටළු වලට වර්තමානයේ මුහුණ පා ඇති නිසා නව දුරටත් පැවති තත්ත්වයෙන් පවත්වාගෙන යාම අසීරු කරුණකි. එම නිසා, **මෙම හේන් ඉඩම් වර්ෂා පෝෂිත බිම් ලෙස සළකා ඒවායේ ස්ථිර වගා ක්‍රමයකට ගොවීන් යොමු කරවිය යුතුය.** එහි දී පැන නඟින ගැටළුවක් වන්නේ ඒ සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමයි. හේන් වගාවේ දී කිසි කලෙකත් බෝග වලට ජලය සැපයීමක් සිදුවන්නේ නැත. එසේම පොහොර සැපයීමක් සිදුවන්නේ ද නැත. **(තෙන්නකෝන් 1986)** නව කැලෑ පෙර මෙන් හෙලි පෙහෙලි කරමින් තැනින් තැනට සංචලනය නොවී ස්ථිර භූමි ඒකක හෝ කීපයක ගොවිතැන් කිරීමේ ක්‍රමයක් ඇරඹීමට හේන් ගොවිතැනේ නියැලෙන ගොවීන්ට සිදු වේ. පොළොවේ ජලය රඳා පවත්වා ගැනීම සඳහා වර්ෂා කාලයේ දී ලැබෙන ජලය පොළොවට උරා ගැනීම සඳහා පස් වැටි ඉදි කිරීම, ගල් වැටි ඉදිකිරීම ආදී උපක්‍රම භාවිතා කිරීමට සිදුවෙයි. සත්ත්ව පාලනය මඟින් සත්ත්ව අපද්‍රව්‍ය ආදිය පසට එක් කිරීමෙන් ද, පසෙහි තෙතමනය ආරක්ෂා කර ගැනීම සහ පස සාරවත් කරන පණු වර්ග ආදිය පසෙහි වර්ධනයට ඉඩ කඩ ඇති වේ. එමඟින් ද, බෝග වගාවට සුදුසු පාංශු තත්ත්වයක් නිර්මාණය වේ. වගාවේ දී කාබනික පොහොර භාවිතය අඛණ්ඩව සිදු කිරීමෙන් ද අවම නිෂ්පාදන වියදමක් යටතේ තිරසාර වගා ක්‍රමයක් පවත්වාගෙන යාමට හැකියාව පවතී.

වගු අංක 1

### ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණය 1993-2003

| වර්ෂය | මිරිස් | කුරක්කන් | බඩ ඉරිඟු | තල | මුං ඇට | රටකජු |
|---|---|---|---|---|---|---|
| 1993 | 34598 | 10315 | 32594 | 9361 | 25108 | 9690 |
| 1994 | 36516 | 9448 | 31495 | 8965 | 22445 | 10436 |
| 1995 | 30592 | 7439 | 35938 | 8560 | 18097 | 9896 |
| 1996 | 26098 | 6129 | 30895 | 7567 | 18261 | 8793 |
| 1997 | 24138 | 5562 | 25796 | 11751 | 16636 | 9177 |
| 1998 | 21632 | 6042 | 29790 | 10355 | 17509 | 10106 |
| 1999 | 21751 | 6488 | 28904 | 8634 | 15362 | 10276 |
| 2000 | 19832 | 6544 | 28646 | 7765 | 12969 | 10534 |
| 2001 | 17353 | 5636 | 25712 | 6839 | 11065 | 9682 |
| 2002 | 16287 | 5477 | 23413 | 6582 | 11248 | 9115 |
| 2003 | 15918 | 7358 | 27060 | 8804 | 12016 | 11383 |

*මූලය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

ආනයන 1993 - 2003 වගු අංක - 2
*12 වෙනි පිටුවට........*

## අතිරේක භෝග ආනයන 1993 - 2003

වගු අංක - 2

| වර්ෂය | බඩඉරිඟු ප්‍රමාණය | බඩඉරිඟු වටිනාකම | තල ප්‍රමාණය | තල වටිනාකම | මුං ඇට ප්‍රමාණය | මුං ඇට වටිනාකම | මිරිස් ප්‍රමාණය | මිරිස් වටිනාකම | කුරක්කන් ප්‍රමාණය | කුරක්කන් වටිනාකම | රටකජු ප්‍රමාණය | රටකජු වටිනාකම | උඳු ප්‍රමාණය | උඳු වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1993 | 80762309 | 535122055 | 6036 | 66013 | 0 | 0 | 933703 | 52827602 | 0 | 0 | 218870 | 2313157 | 0 | 0 |
| 1994 | 84824274 | 587843073 | 67 | 18115 | 0 | 0 | 8346382 | 299330677 | 0 | 0 | 1430590 | 13359276 | 0 | 0 |
| 1995 | 80058626 | 634734929 | 99931 | 2070746 | 0 | 0 | 10820360 | 523895846 | 0 | 0 | 298380 | 7422355 | 0 | 0 |
| 1996 | 91578226 | 1090987082 | 567964 | 12350399 | 21500 | 376635 | 9946181 | 634346419 | 499100 | 4332295 | 1198643 | 31725399 | 0 | 0 |
| 1997 | 90240986 | 887475579 | 109808 | 2378454 | 2091361 | 39938019 | 13268841 | 587548983 | 1253500 | 13612804 | 1756050 | 52834572 | 0 | 0 |
| 1998 | 106536703 | 939701419 | 19138 | 644554 | 5131539 | 113277580 | 19211014 | 1042691329 | 694640 | 8881105 | 2349820 | 80715783 | 0 | 0 |
| 1999 | 125625080 | 1115251903 | 1090746 | 27214065 | 7528367 | 183329789 | 20359099 | 1293705013 | 27690 | 3967822 | 4348024 | 158401528 | 0 | 0 |
| 2000 | 123111998 | 1163355521 | 1030683 | 27604193 | 6767456 | 172548140 | 23363726 | 1327544856 | 551720 | 8931873 | 4399188 | 172957904 | 0 | 0 |
| 2001 | 157402212 | 1796104002 | 844709 | 28050922 | 8716803 | 271433924 | 25897970 | 1525619103 | 815950 | 12740020 | 4892402 | 210159940 | 0 | 0 |
| 2002 | 94595368 | 1206132082 | 303449 | 11137526 | 7121036 | 223082823 | 25336668 | 1680013572 | 1134058 | 17367608 | 5494065 | 233318726 | 0 | 0 |
| 2003 | 136697610 | 1927730350 | 38721 | 1331637 | 8181451 | 241892564 | 27672518 | 2170576837 | 610310 | 9555234 | 2680412 | 79555950 | 7566682 | 220750831 |

මූලය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

## "මේ පරණ තැනමයි.....නේ..."

මගේ වාර්ෂික නිවාඩුවේ දී බ්‍රිතාන්‍යයේ කාලිස්ලේ (Carlisle) හි පිහිටි මගේ ආච්චි සහ සීයා ගේ නිවසේ නැවතී සිටියෙමි. එහි දී මම දුම්රියෙන් රටතුළ සංචාරය කළෙමි. එකී සංචාරයන් හිදී මා ඡායාරූපයන්ට නැඟූ දෑ, මා යළි නිවසට පැමිණි පසු මිත්තනියට පෙන්වූයෙමි. එක් සේයා රුවක දැස රඳවාගත් ඇය මුහුද අසබඩ පිහිටි එකී නගරයේ නම කුමක්දැයි විමසුවාය.

"සෙන් අයිව්ස් (St. Ives)" මම පිළිතුරු දුනිමි.

"නෑ නෑ ........ එහෙම වෙන්න බෑ" ඈ කීවාය.

"මම සෙන් අයිව්ස් ගිහින් තියෙනවා ඒත් ඒක, මේ වගේ නෙමෙයි."

"ආච්චි කවද්ද සෙන් අයිව්ස් ගියේ....." මම විමසුවෙමි.

"ඕ........ මගේ මතකයේ හැටියට 1927 අවුරුද්දේ" ආච්චි පිළිතුරු දුන්නාය.

"Reader's Digest" සඟරාවේ 1994 අගෝස්තු කලාපයේ පළවූ "The Old Place" නමින් Michael Burns විසින් රචිත තීරු ලිපියක පරිවර්තනයයි.

## පටි තද කර ගැනීම......

වසර කිහිපයකට පෙරාතුව, කොරියාවේ රථ වාහන වල ආසන බඳ පටි පොදු භාවිතයේ නොපැවතුණි. පොලීසිය රථ වාහන සෝදිසියේ දී, ඒ පිළිබඳ නිරන්තරයෙන් සැලකිලි මත් විය. එක් රාත්‍රියක මගේ නැන්දණිය පසු පස අසුනෙහි තවත් මගීන් තිදෙනෙකු සිටි කුලී රියකට ගොඩ වැදුනාය. රියදුරුට යාබද අසුනේ අසුන් ගත් ඇය....

"මේ මහා රෑ පොලීසිය ආසන බඳ පටි ගැන තැකීමක් කරන එකක් නෑ නොවේ.....දැ" යි, රියදුරාගෙන් විමසුවාය.

"ඇයි ඔබ පසු පස අසුනේ සිටින මහත්වරුන්ගෙන් ඒ වගක් අහන්නේ නැත්තේ....?" යි පසු පස අසුනේ සිටි පොලිස් නිලධාරීන් තිදෙනා දක්වමින් රියදුරා පිළිතුරු දුන්නේය.

"Reader's Digest" (1994 අගෝස්තු) සඟරාවට කොරියාවේ "In - Jin Kim විසින් රචිත "Buckle Up" හි සිංහල පරිවර්තනයයි.